www.wsws.org ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ටී පාටි ව්‍යාපාරය මූලික මැතිවරනවල දී ලද ජයග්‍රහනය

## The Tea Party primary election victorie

2010 සැප්තැම්බර් 16

අඟහරුවාදා පැවැත්වුනු මූලික රිපබ්ලිකානු මැතිවරනවල දී අන්ත දක්ෂිනාංශික ටී පාටි ව්‍යාපාරයේ අපේක්ෂකයෝ අනපේක්ෂිත ජයග්‍රහනයක් ලබා ගත්හ. එය වටහා ගත යුත්තේ එක්සත් ජනපදය තුල පැන නැගී ඇති දැවැන්ත සමාජ අර්බුදයේ ද වර්ධනය වන ආර්ථික පීඩනයේ ද පසුබිම තුල ය.

විශේෂයෙන් ම රිපබ්ලිකන් පක්ෂය විරෝධය පෑ අපේක්ෂකයන් දෙදෙනා—එනම් ඩෙලවායෝ සෙනේට් සභාව සඳහා පැවති මූලික මැතිවරනයේ දී ක්‍රිස්ටීන් ඕ'ඩොනෙල් සහ නිව් යෝක් ආන්ඩුකාර තනතුර සඳහා පැවති මූලික මැතිවරනයේ දී කාල් පැලඩිනෝ—ලද ජයග්‍රහනය වනාහි, දේශපාලන පද්ධතිය සම්බන්ධයෙන් පොදු ජනතාව අතර වර්ධනය වෙමින් පවතින කෝපය ද මහජනයා මුලාවෙන් අත්මිදීම ද පිලිබඳ විකෘති පිලිබිඹුවකි.

මෙම මැතිවරනවල ප්‍රතිඵලවලින් සහ ටී පාටි අපේක්ෂකයන් අතින් කලින් පැවති මූලික රිපබ්ලිකානු මැතිවරනවල වඩා තහවුරු වුනු පාලකයන් බලයෙන් නෙරපුනු ප්‍රතිඵලවලින් (ඇලස්කාවේ සෙනෙට් සභිකා ලීසා මුර්කොවුස්කි පරාජය කරමින් පසු ගිය මාසයේ ජෝ මිලර් ලද ජයග්‍රහනය මීත් එකකි) දැවැන්ත දක්ෂිනාංශික මහජන ව්‍යාපාරයක් පැන නැගී ඒම නියෝජනය වෙතැයි මෙයින් කියැවෙන්නේ නැත. මෙම මූලික මැතිවරනවල දී ඡන්දය ප්‍රකාශ කල ඡන්ද දායකයන් සංඛ්‍යාව සියයට 20ක් පමනි. බේදනීය ලෙස පහල මට්ටමක පැවති මෙම ඡන්දදායක සහභාගිත්වය, මහා ව්‍යාපාරික පක්ෂ දෙක කෙරෙහි පුලුල් කලකිරීමක් පිලිබිඹු කලේය.

උදාහරනයක් ලෙස ඩෙලවායෝ මැතිවරනයේ දී මුලු ජනපදය පුරා ප්‍රකාශිත ඡන්ද සංඛ්‍යාව 58,000කටත් වඩා අඩු විය. ටී පාටි ව්‍යාපාරය වුව පහලින් පැන නැගුනු ප්‍රජා මූල ව්‍යාපාරයක් නො වේ. එය රිපබ්ලිකන් පක්ෂ නායකත්වයේම සමහර කොටස්වල නිර්මානයකි. මාධ්‍ය නිර්දය ලෙස ඊට අනුබල දුන්නේ ය. ෆොක්ස් නිවුස් අධිපති රූපර්ට් මර්ඩොක් සහ කැන්සාස්හි තෙල් ධනපතියන් වන කොක් සහෝදරයන් වැනි බිලියනපති ප්‍රතිගාමීහු නොමසුරුව ඊට අරමුදල් සැපයූහ.

ටී පාටි ප්‍රපංචයෙන් පිලිබිඹු වන්නේ, විශේෂයෙන් ම පොදු ජනතාව වමට නැඹුරු වීමේ ප්‍රවනතාවට මුහුන දීම්වස් දක්ෂිනාංශික දේශපාලනයට පුලුල් පදනමක් නිර්මානය කර දීමට පාලක ප්‍රභූව දරන ඒකාබද්ධ පරිශ්‍රමය යි.

එහෙත්, ඕ'ඩොනෙල් සහ පැලඩිනෝ වැනි ටී පාටි ව්‍යාපාරයේ සහාය ලද අපේක්ෂකයෝ මධ්‍යම පන්තිය මෙන්ම කම්කරු පන්තිය තුල පවා පවතින සාමාජීය වශයෙන් සැබෑ දුක් ගැනවිලිවලට ආයාචනය කලහ. ඔවුන් ඒ සඳහා ගසා කෑවේ ඔබාමා පාලනාධිකාරයේ සහ ඩිමොක්‍රැටිකයන්ගේ පාලනය යටතේ පවතින කොන්ග්‍රසයේ එක සේ දක්ෂිනාංශික ප්‍රතිපත්තිවලින් උරුම කල දේශපාලන රික්තය යි.

ආන්ඩුව වෝල් වීදියට ඇප දී බේරා ගැනීම, ඔබාමා ක්‍රියාවට දමමින් සිටින වියදම් කැපීමේ වැඩ පිලිවෙල, ව්‍යාපාරික හිතැති සෞඛ්‍ය රැකවරන "ප්‍රතිසංස්කරන" සහ සංගත ප්‍රභූවට ලබා දුන් අනෙකුත් සහන සම්බන්ධයෙන් මෙන්ම ඇමරිකානු මිලිටරිවාදය උත්කර්ෂයට නැංවීම සහ සංක්‍රමනිකයන්ට, ගබ්සා කිරීම පිලිබඳ අයිතීන්ට, සමලිංගිකයන්ට යනාදි වශයෙන් එල්ල කරනු ලබන ප්‍රතිගාමී ප්‍රහාරයන් ද සම්බන්ධයෙන් ඔවුන් එකසේ ආන්ඩුව හෙලාදැකීමට ඉදිරිපත් වෙති.

ඔවුන්ගේ ජනතාවාදී කියා පෑම් මුලුමනින් ම වංචනික ය. ඔවුන් යෝජනා කරන විසඳුම් එනම්, මූලික පොදු සමාජ වැඩ සටහන් පුලුල් ලෙස කප්පාදු කිරීම මෙන් ම බිඳ විසුරුවා හැරීම, රාජ්‍ය අංශයේ සේවකයන්ට වඩා තියුනු ප්‍රහාර එල්ල කිරීම—ඔබාමා ක්‍රියාවට දමන ප්‍රතිපත්තිවලටත් වඩා දරුනු ය.

ඩෙලවායෝහිදී ඕ'ඩොනෙල් තමන් හඳුන්වා ගත්තේ සංස්ථාපිතයට විරුද්ධ අපේක්ෂිකාවක වශයෙනි. ඔබාමා ඉදිරිපත් කල සෞඛ්‍ය රැකවරන පනත අවලංගු කිරීමට සහාය දෙන බවට ඈ ප්‍රතිඥා දුන්නා ය. ඈ බෙහෝ ආනුභාවයක් ලද හිටපු ආන්ඩුකාරයෙකු සහ වත්මන් කොන්ග්‍රස් සභිකයෙකු වන මයිකල් කාසල් පරාජය කලා ය. නියමිත වේලාවට තම පාසල් නය සහ බදු ගෙවීමට අසමත් වී ඇති බව ප්‍රකාශ කරමින් ඇය අපකීර්තියට පත් කිරීමට කාසල්ගේ මැතිවරන

ව්‍යාපාරය දැරූ ප්‍රයත්න ඈ සිය වාසියට හරවා ගත්තේ ඉන් පෙන්නුම් කෙරෙන්නේ ඇයත් ඩෙලාවරිහි ජීවත් වන අනෙක් බොහෝ දෙනා මෙන්ම දුෂ්කර කොන්දේසි යටතේ ජීවත් වන්නේය යන්න බව පවසමිනි.

මිලියනපති නිශ්චල දේපල ව්‍යාපාරිකයෙකු වන පැලඩිනෝ තමන් හඳුන්වා ගත්තේ පොහොසතුන්ට සහ බලවතුන්ට එරෙහි රනවිරුවෙකු ලෙස ය. බැංකු වෙතින් විරුද්ධත්වය පල වුනු ක්‍රෙඩිට් කාඩ් පත් පිලිබඳ පනතක් පරාජය කිරීමට කොන්ග්‍රසය තුල සිටි සිය හිටපු සගයන් පෙලඹවීමට හුවමාරුවක් වශයෙන් 2008 දී එක්සත් ජනපද ඩොලර් මිලියන 1.3ක ප්‍රසාද දීමනාවක් ලබා ගැනීම සම්බන්ධයෙන් ඔහු සිය ප්‍රතිවාදියා වූ රික් ලැසියෝට පහර දුන්නේ ය (ඔහු මෙම දීමනාව ලබා ගත්තේ, බදු ගෙවන්නන්ගේ මුදලින් ආන්ඩුව, එක්සත් ජනපද ඩොලර් බිලියන 25ක බේරා ගැනීමේ ඇපයක් බැංකු වලට ලබා දෙමින් සිටිය දී ය). ලැසියෝ හිටපු කොන්ග්‍රස් සභිකයෙකු ද එමෙන් ම, ජේ.පී. මෝගන් බැංකුවේ විධායකයෙක් ද වේ.

අඟහරුවාදා රාත්‍රියේ ලබා ගත් ජයග්‍රහනයෙන් පසුව පැලඩිනෝ මෙසේ කියා සිටියේ ය: "මේ රාත්‍රියේ දී පාලක පන්තිය දැන ගන්නවා ඇත්තේ සිදු වෙමින් තිබෙන්නේ මහජන විප්ලවයක් බවයි. ඒ ගොල්ලන් දැන් ඒක දකිමින් ඉන්නෙ."

විප්ලවවාදී යැයි කියනු ලබන මෙම ප්‍රකාශ කැඳවුම් කරන්නේ, නිව් යෝක් ප්‍රාන්ත රාජ්‍ය අයවැය ද දුප්පතුන් සහ ආබාධිතයන් උදෙසා ආන්ඩුව ක්‍රියාවට නංවන මෙඩිකෙයාඩ් සෞඛ්‍ය රැකවරන පද්ධතියට කරන වියදම සියයට 20කට වැඩි ප්‍රමානයකින් කපා දැමීම ද සඳහා ය. රාජ්‍ය සේවක වෘත්තීය සමිතිවලට මීට වඩා තියුනු ප්‍රහාර එල්ල කල යුතු යැයි ද ඔහු ඉල්ලා සිටියේ ය.

ව්‍යාජ ජනතාවාදී වාචාල කථා සහ කම්කරු පන්ති විරෝධී දුෂ්ට වූ ප්‍රතිපත්ති අතර ඇතිව තිබෙන මෙම විකාරරූපී සංයෝගය සිදු විය හැක්කේ මහජනතාවන්ගේ සැබෑ හැඟීම් ක්‍රමානුකූලව යටපත් කරනු ලබන සහ නිල මාධ්‍ය හෝ දේශපාලන ආයතන තුල සමාජවාදී ස්වරූපයේ විරුද්ධත්වයක් ප්‍රකාශයට පත් කිරීමට කිසිදු ඉඩක් නොදෙන රටක් තුල පමනකි.

බොහෝ දුරට කෙටි කාලීන මැතිවරන කාරනා නිසා රිපබ්ලිකන් සංස්ථාපිතය ටී පාටි ව්‍යාපාරයේ සහාය ලබන කැරලිකාරී අපේක්ෂකයන් බොහෝ දෙනෙකුට විරුද්ධත්වය පල කර ඇති නමුත්, ඔවුන් නගා සිටුවීම, පාලක පන්තියට ප්‍රයෝජනවත් කාර්යයක් සඳහා සේවය කරයි. එය පොදුවේ මුලු මහත් දේශපාලන පද්ධතිය ම තව දුරටත් දකුනට තල්ලු කිරීම සඳහා පහසුකම් සපයයි.

විරැකියාව නිසා ඇවිලී ඇති මහජන අතෘප්තියේ වර්ධනය එහි දේශපාලන ප්‍රකාශනය සොයා ගෙන ඇත්තේ දක්ෂිනාංශය තුලය. මීට හේතුව, සමාජ අර්බුදයට මොන යම් හෝ විසඳුමක් ලබා දීම සඳහා ඔබාමා පාලනාධිකාරයට සහ ඩිමොක්‍රැටිකයන් නායකත්වය දෙන කොන්ග්‍රසයට පවතින පූර්න නොහැකියාව යි.

ඔබාමා බලයට පත් වූයේ මහා අවපාතයෙන් මෙපිට ඇති වූ ගැඹුරුතම ආර්ථික අර්බුදයක් මධ්‍යයේ, බුෂ් සහ රිපබ්ලිකානුවන් මහජනයා වෙතින් අතුගෑවී යාමේ ප්‍රතිඵලයක් ලෙස හා කොන්ග්‍රස් මන්ඩල දෙක තුල දී ම දැවැන්ත බහුතරයකගෙන් සහාය ලැබීමේ වාසිය ගනිමිනි. වැඩ භාර ගත් පලමු දිනයේ පටන් ම ඔහු ක්‍රියා කලේ තමන්ට කලින් බලයේ සිටි ජනාධිපතිවරයාගේ සංගත හිතැති, කම්කරු පන්ති විරෝධී ප්‍රතිපත්ති නිර්දය ලෙස දිගින් දිගට ම පවත්වා ගෙන යාමට සහ තීව්‍ර කිරීමට ය.

මහජනයා මුලාවෙන් අත්මිදීම සහ ඔබාමාගේ ආන්ඩුව කෙරෙහි ඔවුන් තුල ඇති කලකිරීම මැනිය හැකි එක් මිම්මක් නම් ඇමරිකානු විශ්ව විද්‍යාලයේ ඇමරිකානු ඡන්ද කොට්ඨාස අධ්‍යයන මධ්‍යස්ථානය මෙම සතියේ වාර්තා කල කරුන යි. එනම්, 1930 ගනන්වලින් මෙපිට පලමු වතාවට, රිපබ්ලිකානු ආරම්භක මැතිවරනවල සහභාගිත්වය ඩිමොක්‍රැටික් ආරම්භක මැතිවරනවල සහභාගිත්වය ඉක්මවා ගොස් තිබීමේ කාරනයයි.

නේෂන් වැනි වාම ලිබරල්වාදීන්ගේ සහ ජාත්‍යන්තර සමාජවාදී සංවිධානය වැනි ව්‍යාජ සමාජවාදී මධ්‍යම පන්තික කන්ඩායම්වල ඉදිරි දර්ශනය—එනම්, ඩිමොක්‍රැටික් පක්ෂයට ආයාචනය කිරීමෙන් දක්ෂිනාංශික බලවේගවල වර්ධනය නතර කල හැකි ය යන්න—අත්‍යන්තයෙන් ම බංකොලොත් ය. අන්ත දක්ෂිනාංශික කොටස්වල වර්ධනයට පහසුකම් සැපයෙන්නේ කම්කරු පන්තිය දිගින් දිගට ම ඩිමොක්‍රැටික් පක්ෂයට දේශපාලනිකව යටත් කිරීම නිසා ම ය.

මෙම අර්බුදය විසින් කම්කරු පන්තිය හමුවේ මතු කෙරෙන්නේ ඩිමොක්‍රැටික් පක්ෂයෙන් බිඳී වෙන් වී මහ ව්‍යාපාරිකයන්ගේ පක්ෂ දෙකට සහ ඔවුන් ආරක්ෂා කරන ධනපති ක්‍රමයට විරුද්ධව ස්වාධීන සමාජවාදී ව්‍යාපාරයක් ගොඩ නැගීමේ අවශ්‍යතාව යි.

බැරී ග්‍රේ

© www.wsws.org